# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 14
NUMBER 02

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

MAY 10, 2011 මැයි මාසය (බුද්ධ වර්ෂ 2555 වෙසක් මාසය)    http://www.lankaheritage.com/lankaviththi/


# අන්තො ජටා බහි ජටා



## ඇතුළත අවුල් පිටතද අවුල්

**කීර්ති ජයසුන්දර විසිනි**

**අන්තො ජටා බහි ජටා**
**ජටාය ජටිතා පජා**
**තං තං ගොතම පුච්ඡාමි**
**කො ඉමං විජටයෙ ජටං**

බුද්ධඝොෂ හිමියන් විසින් රචනා කරන ලද උසස් ධර්ම ග්‍රන්ථයක් වන විශුද්ධිමාර්ගයට (path of purification) පාදක වී ඇත්තේ බුද්ධ දේශිත ගාථා දෙකකි. ඉහළින් දැක්වෙන්නේ ඒ එක් ගාථාවකි.

මෙහි ජටා යන්නෙහි අදහස ගැට හෙවත්, ගැටලු හෙවත්, අවුල් ය. ප්‍රශ්න, පටලැවිලි ආදිය ද ජටා වශයෙන් ගත හැකිය. අන්තො ජටා යනු ඇතුළත ඇති අවුල්ය, ඇතුළත ඇති ගැටලුය, ඇතුළත ඇති ප්‍රශ්නය.

බහි ජටා යනු බාහිර හෙවත් පිටත ඇති ගැටලුය. බාහිර ප්‍රශ්නය. පිටත ඇති අවුල්ය. එක් බ්‍රාහ්මණ තරුණයෙක් බුදුන්ගෙන් ඇසූ ප්‍රශ්නයකි ඉහත ගාථාව. එහි සිංහළ තේරුම මෙසේ වෙයි.

“ ඇතුළත අවුල්ය පිටතද ඇත්තේ අවුල්ය. සකල ලෝක ජනතාව අවුල් පිට අවුල් වලින් වෙළී සිටිති. එහෙයින් ගෞතමයින් වහන්ස මම ඔබෙන් අහන්නෙ මෙයයි. මේ ඇතුළත පිටත ගැටලු විසඳන්න හැක්කේ කාටද ? ”

### අවුල් වූ අද ලෝකය

මේ අවුල් සහගත තත්වය මේ ගතිය අද අප රටේ පමණක් නොව සමස්ත ලෝකය පුරාම දක්නා ලැබෙයි. හැම රටක්ම ඇතුළත පිටත ගැටළු වලට මැදිවී සිටිති. හැම තැනකම අවුල්ය. ඒවාට යොදන විසඳුම් මොනවාදැයි කිසිවෙකුට නොතේරෙයි. බොහෝ විසඳුම් යොදන්නට ගොස් රටවල් තව තවත් අවුල් වල පැටලෙති.

### අපේ ඇතුළත හා පිටත ජටා

ලෝකයේ අන් රටවල් ගැන කතාකරන්නට පෙර අපේ රට ගැන හා අපේ ගැටලු ගැන කතකරන්නට බොහෝ දේ ඇත. පටන්ගත යුත්තේ එතැනිනි.

අවුරුදු තිහක් තිස්සේ අපි ලොකුම අවුලකට මුහුණ දී සිටියෙමු. ඒ අන්තො ජටාවකි. අපේ ගෙදරම ප්‍රශ්නයකි. එහෙත් ඒ ඇතුළත ප්‍රශ්නය කිසිසේත් විසඳන්නට බැරි තත්වයකට හැරුණේය. එක එක අන්දමෙන් සිතා බැලුවෙමු. එහෙත් තත්වය එන්න එන්නම අවුල් සහගත විය. අවසානයේ කිසියම් ප්‍රඥාවක් අපහට හිටිවනම පහළ වීමේ හේතුවෙන් ඒ දෘඪ ප්‍රශ්නය බේරුම් කරගන්නට හැකිවිය.

ගැටලුව ලිහාගත්තායයි අප සිතුවද නොසිතූ වෙනස් අන්දමේ ප්‍රශ්න හා වෙනත් අවුල් සහගත තත්වයන් මතු වන්නට පටන් ගත්තේය. යුද්ධය මෙහෙයවූ හමුදාපතිවරයාම හමුදාවට චෝදනා එල්ලවන අන්දමේ ප්‍රකාශයක් කළ නිසා ඉන් ඇතිවූයේ තවත් අවුලකි. ඉන්පසු ඒ හමුදාපතිවරයා හිරගෙට යැවීමෙන් වෙනත් අන්දමේ අවුල් ඇතිවුණි. රජයට පක්ෂව සිටි අය දෙපිළකට බෙදුණි. ඒ අවුල තව තවත් ඇදෙමින් යයි. ඇතැම් රටවලින් ශ්‍රීලංකාවට තවමත් යුද අපරාධ චෝදනා එල්ල වෙයි. එක්සත් ජාතීන් ඒ චෝදනා පිරික්සන්නට කමිටු පත්කර එවන බව කියයි. ලංකාව ඒ එන කමිටුවලට එන්න එපා යයි කියයි. දැන් අප රට වැටී ඉන්නේ අප යුධ අපරාධකාරයන් ලෙස ඔප්පුවේද නැද්ද යන දෙගිඩියා අවුල මතය.

### මැති ඇමති අවුල් වැඩ

රජයක් ක්‍රියා කළ යුත්තේ එක ප්‍රතිපත්තියක් මතය. එහෙත් ලංකා රජයේ විවිධ මැති ඇමතිවරු විවිධ අන්දමට ක්‍රියාකරන බව ප්‍රකාශ නිකුත්කරන බව පෙනේ. මේ නිසා රජයේ හරි ස්ථාවරය කුමක් දැයි පැහැදිලි නැත. එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැන්කි මූන් ට චෝදනා කරන රජයේ ඇතැම් මැති ඇමතිවරු කොළඹ එහි ප්‍රධාන කාර්‍යාලය ඉදිරිපිට උද්ඝෝෂණ හා උපවාසද කරන අතර. තවත් ප්‍රධාන ඇමතිවරු ප්‍රකාශ කරන්නේ බැන්කි මූන්ට බැන වැදීමෙන් හා ඔහුගේ පඹයන් පිච්චීමෙන් තවත් අවුල වැඩිවනු ඇති බවයි. මෙවැනි කරුණකදී රජයේ මැති ඇමතිවරුන්ට එක මතයකට එන්නට බැරි ඇයි.? ජනාධිපතිවරයා මෙහිදී පවසනවා ඇත්තේ කුමක්ද යන්නත් කාටවත් පැහැදිලි නැත. මෙය හොඳ දෙයක් නොවේ. මක්නිසාද යත් ජාත්‍යන්තර වශයෙන් බලපාන කාරණාවල වගකීම කෙලින්ම වැටෙන්නේ රටේ නායකයා මතට බැවිනි.

### රුසියා චීන අවවාද

මේ නොබෝදා ලංකාවට පක්ෂපාතීව සිටිනරුසියාව හා චීනය කිසියම් අවවාදයක් දී ඇති බව ලංකාවේ පුවත්පත් වල පළවිය. ඒ අවවාදය නම් දැන් බැංකි මූන් පස්සේ පන්නන්නවත්, එක්සත් ජාතීන්ට පහර ගසන්නටත් එපා යන්නය. එය කිසි තේරුමක් නැති වැඩක් බවද පෙන්නා දී ඇත. මේ අවවාදය ලංකාව පිළිගෙන ඇති බව පෙනෙයි. දැන් දැන් ඇතැම් මැති ඇමතිවරුද බැන්කි ගැන හෝ එක්සත් ජාතීන් ගැන වැඩිය කතා කරන්නේ හෝ බනින්නේ හෝ නැත.

4 වන පිටුවට →

## ඔබ සැමට ශුභ වෛශාක්‍ය මංගල්‍යයක් වේවා!



**Just as a mother protects her only child,**
**even at the risk of her life,**
**One should cultivate**
**boundless clemency,**
**towards all living beings.**
**Said the Awakened Master,**
**with oceans of compassion.**
**Then the entire universe**
**illuminated by his words,**
**banishing the darkness of**
**hatred and ignorance.**
**As my only refuge,**
**Homage! to the Blessed One.**
**In the morning, noon and**
**evening, all the same**

♦ *Daya Ananda*

The 5th century stone carving belonged to Guptha era depicts Sakyamuni’s first sermon preached to his five disciples at Isipathana deer park in Benares.

මවක් රකිනා ලෙස එකම පුතු
තමන් ප්‍රාණය නොසලකා හැර
සියල් සතුනට වඩන ලෙස මෙත
ලොවට වදහළ කුළුණු සාගර
අවිද්‍යාවෙන් අඳුරු සක්වල
එකළු කළ භගවත් දිවා කර
දොහොත් මුදුනත තබා වඳිනෙමි
උදය, දහවල, රැයද එක යුර

♦ *දයා ආනන්ද*




විස්තර පිටු අංක 3